චක්‍රලේඛ අංක: 04/2004

මගේ අංකය: බප/සසේකො/ලේ/නිර්
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.)
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2004.09.21

බස්නාහිර පළාතේ සියලුම
සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>අයවැයෙන් වැඩි කළ රු. 1250/- ක දීමනාව</u>
<u>සමුපකාර සේවකයන්ට ලබා දීම</u>

මෙම කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් දීමනාව අදාල සමිතිවල (සේවකයන්ට) ගෙවීම සම්බන්ධයෙන් අදහස් විමසූ අතර ඇතැම් සමිති විසින් එට හැකියාව ප්‍රකාශ කර ඇතත්, තවත් සමිති සංඛ්‍යාවක් තම අරමුදල් තත්ත්වය අනුව එම දීමනාව ගෙවීමට ශක්තියක් නොමැති බව දැනුම් දී තිබේ. ඒ කෙසේ වෙතත් සමුපකාර සේවකයන් සඳහා කිසියම් අමතර දීමනාවක් ලබා දීම සුදුසු බව බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිළිගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් ගේද එකඟතාවය ලැබී ඇත. ඒ අනුව ඉදිරියේදී ගනු ලබන තීරණ අනුව සංශෝධනය කළ හැකි පරිදි මෙම දීමනා සමුපකාර සේවකයන්ට ලබා දීමට බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කරනු ලැබ ඇත.

02. දීමනා ගෙවිය හැකි වනුයේ පහත සඳහන් කොන්දේසිවලට යටත්වය.

1. කොමිෂන් සභාව විසින් දැනට අනුමත කර ඇති දීමනා වලට අමතරව මෙම දීමනාව ගෙවීම සහ එය වැටුපට අයත් නොවන අතිරේක දීමනාවක් සේ සැලකීම.

11. විවිධ සේවා සමුපකාර සමිතිවල එජ් 28 මාසික මෙහෙයුම් වාර්තාවේ ග්‍රාමීය බැංකු අංශය හැර අනෙකුත් සියළු මාර්ග වලින් උපයන ලාභාංශ පදනම් කොට මෙම දීමනාව ගෙවීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණ ගතයුතු ය.

| ලාභාංශ සීමා (මාසික අතිරික්තය) (ග්‍රාමීය බැංකු අංශය හැර) | ගෙවිය යුතු අතිරේක දීමනාව |
|---|---|
| ලක්ෂ 6 ට වැඩි | රු. 1250 |
| ලක්ෂ 5 ට වැඩි 6 දක්වා | රු. 750 |
| ලක්ෂ 4 ට වැඩි 5 දක්වා | රු. 450 |
| ලක්ෂ 3 සිට 4 දක්වා | රු. 300 |

03. මෙම දීමනාව ඒ ඒ මාසිකව ලබනු ලබන මාසික අතිරික්තය පදනම් කොට ගෙන ඉහත දැක්වෙන අනුපාතයන් පරිදි සංශෝධනය කොට ගෙවිය හැකි ය.

04. ලාභාංශ සැකසීමේදී සියළු වියදම් අදාල වියදම් වලට භර කොට එජ් 28 වාර්තා පිළියෙල කළයුතු ය.

05. පාඩු ලබන සමුපකාර සමිති හා ලක්ෂ 3 ට අඩු මාසික ලාභයක් සහිත සමුපකාර සමිති සිය ලාභාංශ වැඩි දියුණු කර ගැනීමට ක්‍රියා කොට මාස 3 ක් ඇතුලත සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් මඟින් එම සමිතිවල යෝජනා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

06. පාඩුවත් නොලබනත් සාමාන්‍ය ලාභාංශ ප්‍රමාණයක් ඇති සමිති, එම සමිතිවල පැවැත්ම පිළිබඳ ඉතා දුරදර්ශීව සලකා බලා ඉහත සඳහන් දීමනා වලට අඩු ප්‍රමාණයකින් කිසියම් දීමනාවක් ගෙවීම ගැන ද අධ්‍යක්ෂ මණ්ඩල වලට තීරණයක් ගත හැකි ය.

07. මෙම දීමනාව 2004.09.01 දින සිට ගෙවීමට කටයුතු කළයුතුය.

08. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ද ඇතිව බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසිනි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යතුමා ගේ සම්බන්ධීකරණ නිලධාරී
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්- සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යාංශය (බ.ප.)
4 සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ )
6. ලේකම්- සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තීය සමිති සංගම්